| 10 | වසර අවසානයට මුළු සේවක සංඛ්‍යාව | 112 | 114 | 129 | 144 | 144 |
| | වෙන් කිරීම | | | | | |
| (අ) | මුළු ආදායම ස්වකීය ආදායම | 19% | 21% | 21% | 19% | 17% |
| (ආ) | එක් සේවකයෙකු සඳහා සේවා පිරිවැය | 394.00 | 392.00 | 401.00 | 414.00 | 477.00 |

**කාර්ය සාදක දර්ශක**

| | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|
| ප්‍රතිකාර කළ මුළු රෝගීන් සංඛ්‍යාව | | | | | |
| බාහිර | 131,998 | 247,436 | 264,447 | 274,848 | 265,864 |
| අභ්‍යයන්තර | 11,195 | 13,213 | 15,322 | 15,774 | 12,372 |
| දිනකට රෝගියෙකු සඳහා වියදම | 1,715 | 1,327 | 1,505 | 1,676 | 2,032 |

# රෝගියෙකු සඳහා ඒකක පිරිවැය

**2011** වර්ෂයේ සමස්ථ පිරිවැය මුළු රෝගී දින සංඛ්‍යාවෙන් බෙදීමෙන් සහ බාහිර රෝගී සංඛ්‍යාව **06** න් බෙදීමෙන් මෙම සංඛ්‍යාව ගණන් බලන ලදී.

| | | |
|---|---|---|
| වසර සඳහා මුළු පිරිවැය | | (රු.)**136**,300,178 |
| මුළු රෝගී දින සංඛ්‍යාව | | 22750 |
| මුළු බාහිර රෝගී සංඛ්‍යාව | | 265864 |
| බාහිර රෝගීන් 6 = අභ්‍යන්තර රෝගීන් 1 | | $\frac{265864}{6}$ |
| | = | 44310 |
| මුළු රෝගී දින සංඛ්‍යාව | | 22750 + 44310 |
| | = | 67060 |
| එක් රෝගී දිනයක් සඳහා පිරිවැය | | $\frac{136,300,178}{67060}$ |
| | **= රු** | **2,032** |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: එච්.ඩබ්ලිව්/බී/ඩබ්කේඑම්එච්/ එෆ්එ/2011 | ඔබේ අංකය / உமது இல / No. | දිනය / திகதி / Date: 2012 මැයි 24 දින |

සභාපති,

විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලය.

විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

---

විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලයේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය,හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1999 අංක 38 දරන විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩල පනතේ 13 (3) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)සී වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2012 අප්‍රේල් 10 දින නිකුත් කරන ලදී.

1.2. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිලියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

1.3. විගණකගේ වගකීම.

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිලිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී.ආචාර ධර්ම වල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිලිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone. 2887220
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ.විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කල විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

---

2.1. තත්ත්වාගණනය කළ මතය

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර 2011 දෙසැම්බර් 31 දිනට විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

---

2.2.1. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

---

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 ප්‍රකාරව වත්කමක සාධාරණ අගය විශ්වාසදායී ලෙස මැනිය හැකි විට එහි ප්‍රත්‍යාගණිත අගයට ඉදිරිපත් කල යුතු වුවද, සම්පූර්ණයෙන් ක්ෂයවීම අවසන්ව ඇතත් තවදුරටත් රෝහලේ පරිභෝජනය සඳහා යොදා ගැනෙන වාහන හා වෛද්‍ය උපකරණවල පිළිවෙලින් රු. 4,816,602 හා රු. 22,624,870 ක් වූ පිරිවැය වටිනාකම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්වලට ගෙන නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී රු.5,600,000 ක් වටිනා ඩබල් කැබ් රථයක් භාණ්ඩාගාර ප්‍රතිපාදන මත රෝහල වෙත ලබාදී තිබු නමුත් එය ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගිණුම් වලින් අත්හැර තිබූ මෝටර් රථයට අදාල වාර්ෂික ක්ෂය ප්‍රමාණය රු.1,120,000 ක් වන බැවින් එම ප්‍රමාණයෙන් ක්ෂයවීම් අඩුවෙන් දැක්වෙන බැවින් ඒ හා සමාන ප්‍රමාණයෙන් ඌනතාවයද අඩුවෙන් දැක්වුණි.

(ඇ) සේවකයකුගේ සේවා කාලය සම්පූර්ණ කරන පළමු වර්ෂයේ සිට එම සේවකයා වෙනුවෙන් පාර්තෝෂික ප්‍රතිපාදන සැලසිය යුතු වුවද සමාලෝචිත වර්ෂය තුළ සේවකයන් 28 දෙනෙක් අළුතින් පාර්තෝෂික ප්‍රතිපාදන සඳහා ඇතුළත් කර තිබුණු අතර එයින් රු 1,493,140 මුදලක් ඉකුත් වර්ෂ වෙනුවෙන් කරන ලද ප්‍රතිපාදනයක් වන බැවින් සමාලෝචිත වර්ෂයේ ඌනතාවද ඒ හා සමාන අගයෙන් වැඩි වී තිබුණි.

### 2.2.3. නීති,රීති, රෙගුලාසි හා කළමනාකාරීත්ව තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) 2007 මැයි 11දිනැති අංක 09/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | විශ්‍රාම ගොස් නැවත සේවයේ යොදවන ලද රෝහලේ පරිපාලන නිලධාරීහට විශ්‍රාම යන අවස්ථාවේ අවසන් වරට ලැබූ වැටුපෙන් 50% ක් හෝ රු. 10,000 යන දෙකෙන් වැඩි මුදල ගෙවිය යුතු වුවද දීප ව්‍යාප්ත සේවාවල II/III ශ්‍රේණි හෝ ඊට සමාන තනතුරු දරන නිලධාරීන්ට නිමි විශ්‍රාම යන අවස්ථාවේ අවසන් වරට ලැබූ වැටුපෙන් 50% ක් හෝ රු. 17,500 ක් යන දෙකෙන් වැඩි මුදල අනුව දීමනා ගෙවීම හේතුකොට ගෙන රු. 106,132 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. |
| (ආ) 2011 සැප්තැම්බර් 29 දිනැති අංක එම්එච්/එඩී/01/ඒ/ජී041 දරන සෞඛ්‍ය අමාත්‍යංශ ලේකම් ලිපිය | වයස අවුරුදු 60 ඉක්ම වූ සේවකයන් සමාලෝචිත වර්ෂයේ අගෝස්තු වලින් පසුව නැවත සේවයේ නොයෙදවිය යුතු අතර විශේෂ හේතු මත සේවයේ යෙදවීම අවශ්‍ය වන්නේනම් ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබා ගත යුතු වුවද එයට පටහැනිව රෝහලේ පරිපාලන නිලධාරී ඇතුළු සෙද නිලධාරීන් 04 දෙනෙකු අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත පදනම්ව සේවා දීර්ඝ කිරීම් සිදු කර තිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය.

3.1. මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා ආරෝග්‍යශාලා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය රු.3,944,390 ක ඌනතාවයක් පෙන්නුම් කරන ලද අතර , ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා රු.6,510,215 ක ඌනතාවයක් විය. ඉකුත් වර්ෂයට අදාළ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,565,825 ක වර්ධනයක් ඇති වීම සඳහා ප්‍රධාන වශයෙන්ම රාජ්‍ය ප්‍රදාන රු. 18,181,000 කින් වැඩිවීමට සාපේක්ෂව වියදම්හි රු. 10,955,879 ක වැඩි වීමද වෙනත් වියදම්හි රු. 1,754,289 ක වැඩි වීමද, පාරිතෝෂික වියදම රු. 1,373,351 ක වැඩිවීමද බලපා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1. කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ කාර්යසාධනය ඉකුත් වසර හා සසඳා පහත දැක්වේ.

| | 2011 | 2010 | වැඩිවීම/(අඩුවීම) | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | | | | % |
| ප්‍රතිකාර ලත් බාහිර අංශයේ රෝගීන් සංඛ්‍යාව | 130,649 | 134,775 | (4,126) | (3.06) |
| හදිසි ප්‍රතිකාර ඒකකය | 19,887 | 20,176 | (289) | (1.43) |
| සායන සඳහා පැමිණි රෝගීන් සංඛ්‍යාව | 115,328 | 119,897 | (4569) | (3.81) |
| නේවාසික රෝගීන් සංඛ්‍යාව | 12,372 | 15,272 | (2900) | (18.98) |
| | 278,236 | 290,120 | 11,884 | |
| සිදු කරන ලද අක්ෂි ශල්‍යකර්ම ගණන | 7,771 | 11,737 | (3,966) | (33.79) |
| ලේසර් කිරීම් සංඛ්‍යාව | 3,444 | 4,141 | (697) | (16.83) |
| සිදු කරන ලද සාමාන්‍ය ශල්‍යකර්ම ගණන | 55 | 100 | (45) | (45) |
| රසායනාගාර පරීක්ෂණ සංඛ්‍යාව | 43,502 | 40,756 | 2,746 | 6.73 |
| X- ray පරීක්ෂණ සංඛ්‍යාව | 3,543 | 3,367 | 176 | 5.22 |
| ඊසීජී පරීක්ෂණ සංඛ්‍යාව | 2,738 | 2,331 | 407 | 17.46 |
| රසායනාගාර ද්‍රව්‍ය වියදම රු. | 414,047 | 749,582 | (335,535) | (44.76) |
| පාරිභෝගික හා වෛද්‍ය උපකරණ රු. | 870,821 | 3,499,212 | (2,628,391) | (75.11.) |
| එක්ස්රේ ද්‍රව්‍ය හා රසායනික ද්‍රව්‍ය රු. | 33,087 | 29,740 | 3,347 | 11.25 |
| ඖෂධ වියදම රු. | 23,537,795 | 20,643,563 | 2,894,232 | 14.02 |
| රෝගීන් සාමාන්‍ය සංඛ්‍යාව | 54,034 | 57,911 | (3,877) | (6.69) |

| | | | | |
|---|---|---|---|---|
| රෝගියකුගේ දිනක වියදම රු. (ක්ෂයවීම් ද ඇතුළත්ව) | 2,522 | 2 083 | 439 | 21.07 |
| රෝගියකුගේ දිනක වියදම (ක්ෂයවීම් හා පාරිතෝෂික වෙන් කිරීම් නොමැතිව) රු. | 2,220 | 1.851 | 369 | 19.93 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සායන සඳහා පැමිණි රෝගීන් සංඛ්‍යාව සහ නේවාසික රෝගීන් සංඛ්‍යාවෙහි පිලිවෙලින් 3.81% ක් හා 18.98% ක අඩුවීමක් දක්නට ලැබුණි.

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සිදු කරන ලද අක්ෂි ශල්‍යකර්ම සංඛ්‍යාව 33.79 % කින් අඩු වී තිබුණ අතර ලේසර් කිරීම් 16.83% කින් අඩු වීතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව ඖෂධ වියදම 14.02% කින් වැඩි වී තිබුණ අතර සාමාන්‍ය රෝගීන් සංඛ්‍යාව 6.69% කින් අඩු වී තිබුණි.

(ඈ) 2010 වර්ෂයේ සාමාන්‍ය ශල්‍යකර්ම 100 ක් සිදු කර තිබුණ අතර සමාලෝචිත වර්ෂයේ සිදු කර තිබුණේ ශල්‍යකර්ම 55 ක් පමණි. පසුගිය වසරට සාපේක්ෂව එය 45 % ක අඩු වීමක් බව පෙන්නුම් කරනු ලබයි.

(ඉ) බාහිර ශල්‍යාගාරයක් භාවිතා කිරීම හේතුකොටගෙන සමාලෝචිත වර්ෂයේදී රු.4,532,266 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදු වු අතර සිදු කළ ශල්‍ය කර්ම සංඛ්‍යාව 6635 ක් විය. ඒ අනුව එක් ශල්‍යකර්මයක් සඳහා දැරීමට සිදු වු අතිරේක පිරිවැය රු.683 ක් වූ අතර එය 2010 වර්ෂයට සාපේක්ෂව 33% කින් ඉහල ගොස් තිබුණි.

4.2. කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) රෝහලේ ශල්‍යාගාරය වෙනුවට අක්ෂිදාන සංගම් ශල්‍යාගාරය භාවිතයට ගැනීමේදී ගාස්තු පිළිබඳව එකඟතාවයක් නොතිබුණි. පසුව පිරිවැය ලෙස රු.2,916,551 ක බිල්පතක් අක්ෂිදාන සංගමය ඉදිරිපත් කර තිබුණු අතර එයින් රු.1,115,037 ක් පමණක් රෝහල විසින් ගෙවා තිබුණි.

(ආ) රෝහලේ ලිපිද්‍රව්‍ය සහ සාමාන්‍ය පාරිභෝජන ද්‍රව්‍ය ඉතිරි තොගය වර්ෂයේ පාරිභෝජනයට සාපේක්ෂව 59% ක් සහ 64% ක්ව පැවති අතර ලිනන් අයිතම ඉතිරි තොගය වර්ෂයේ පාරිභෝජනයට සාපේක්ෂව 194% ක මට්ටමක පැවතුණි.

(ඇ) රු. 11,532,317 ක් වැය කර 2010 වර්ෂයේදී මිලදීගත් ලැපරස්කොපි යන්ත්‍රය භාවිතයට ගෙන නොතිබුණි. තවද යන්ත්‍රයේ වගකීම් කාලය මාස 24 ක් වන බැවින් එම වගකීම් කාලය තුල යම් දෝෂ සහගත තත්ත්වයක් ඇති වුවහොත් ලබාගත හැකිව තිබූ වාසිදායක තත්ත්වය යන්ත්‍රය භාවිතා නොකිරීම තුලින් අහිමි වී තිබුණි.

(ඈ) පාරිභෝගික භාණ්ඩවල බෙහෙවින් මිල ඉහල යන කාලයේදී මිල ගණන් කැඳවා එය පදනම් කරගෙන මුළු වර්ෂයටම ආහාර සැපයීමේ කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

(ඉ) මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කරන ලද තොග සත්‍යාපන වාර්තා සත්‍ය වශයෙන්ම භෞතික සමීක්ෂණයක් මගින් තහවුරු කරගත් වාර්තා නොවන බවට විගණනයේදී සනාථ විය.

4.3 කොන්ත්‍රාත් පරිපාලන දුර්වලතා

රෝහලේ වායු සමීකරණ පද්ධතියේ අලුත්වැඩියා වියදම රු.3,340,960 ක් වූ අතර ඒ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) කොන්ත්‍රාත් ආයතනය සමඟ ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ආ) අළුත්වැඩියාව කරගෙන යන අතරතුරදී අමතර සහ අතිරේක වැඩ ලෙස රු. 3,213,280 ක ප්‍රමාණයක් දක්වා තිබුණු අතර එය මුල් කොන්ත්‍රාත්තුවේ වටිනාකමින් 96% ක් වී තිබුණද, එයට අදාල අනුමැතීන් ලබාගෙන නොතිබුණි.

(ඇ) අමතර සහ අතිරේක වැඩ සඳහා අමාත්‍යාංශයීය කාර්මික ඉංජිනේරුවරයාගෙන් ඇස්තමේන්තුවක් ලබාගෙන නොතිබුණි.

(ඈ) ශල්‍යාගාරයේ බිම සැකසීම සඳහා වර්ග අඩි 2055 ක් සඳහා රු. 1,611,120 ක ගාස්තුවක් ගෙවා තිබුණි. විගණනයේදී සිදු කරනු ලැබූ භෞතික මැනුම්වලට අදාලව නිම කරනු ලැබූ බිම් ප්‍රමාණය වර්ග අඩි 1619 ක් වූයෙන් වර්ග අඩි 436 ක් සඳහා වැඩිපුර ගෙවා තිබූ මුදල රු. 341,824 ක් විය.

(ඉ) බිම් සැකසීම සඳහා කරන ලද වැඩ කොටසේ රු. 798,000 ක වැඩ පමණක් සහතික කර තිබියදී රු. 1,611,120 ක ගාස්තුවක් රෝහල විසින් ගෙවා තිබුණි.

5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

5.1 ක්‍රියාකාර සැලැස්ම

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාර සැලැස්මට අනුව ඊසීජීක්ස් යන්ත්‍රය මිලදී ගැනීමේ කටයුතු තෙවන කාර්තුව අවසන් වන විට අවසන් කල යුතු වූවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) පැරණි ගොඩනැගිල්ලේ වහලය අළුත්වැඩියා කිරීම ආරම්භ කර 3 වන කාර්තුවේදී 75% ක් නිම කිරීමට සැලසුම් කර තිබුණද එය ආරම්භ කර නොතිබුණි.

(ඇ) අධිපීඩන වන්ධ්‍යකරණ යන්ත්‍රය සහ කැමරාව සහිත SLIT ලාම්පුව (High Pressare Sterilizer සහ SLIT lamp with camera) යන උපකරණ දෙක පිළිවෙලින් තෙවන කාර්තුවේ සහ දෙවන කාර්තුවේ මිලදී ගැනීමේ කටයුතු අවසන් කිරීමට නියමිත ලෙස දක්වා තිබුණද, එම උපකරණ මිලදී ගෙන නොතිබුණි.

5.2 අයවැය ලේඛනමය පාලනය.

අයවැය ලේඛනය හා සත්‍ය ආදායම් හා වියදම් අතර 8% සිට 1616% දක්වා වූ විචලනයන් වූයෙන් ඵලදායී කළමණාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කල යුතු වේ.

(අ) පරිත්‍යාග සේවා සැපයීම
(ආ) ඖෂධ නිකුත් කිරීම
(ඇ) කොන්ත්‍රාත් පාලනය
(ඈ) තොග පාලනය

එච්.ඒ.එස්. සමරවීර
විගණකාධිපති

# විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලාව
விஜய குமாரதுங்க ஞாபகார்த்த வைத்தியசாலை
WIJAYA KUMARATUNGA MEMORIAL HOSPITAL
සීදූව சீதுவை SEEDUWA




ඔබේ අංකය : HW/B/WKMH/FA/2011
මගේ අංකය :WKMH/BK/01/2011
දිනය :2012.05. 2

ඒ.එච්.එම්.එල්.අබේවල මහතා
සහකාර විගණකාධිපති,
අංක 306/72 ,පොල්දූව පාර ,
බත්තරමුල්ල.

**විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (ඕ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

ඉහත කරුණ හා සම්බන්ධ ඔබේ සමාංක හා 2012.04.18 දිනැති ලිපිය හා බැඳේ.

## *2.2.1. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති*

සම්පූර්ණයෙන්ම ක්‍ෂය වීම් අවසන් ව ඇතත් තවදුරටත් රෝහලේ පරිභෝජනය සඳහා යොදා ගැනෙන මූල්‍යමය වටිනාකමක් ආරෝපනය කලහැකි වාහන, වෛද්‍ය උපකරණ ආදී වත්කම් හඳුනාගෙන නැවත ප්‍රත්‍යාගණනය කර පොත්වලට ගැනීමේ කටයුතු 2012 වර්ෂයේදී සිදු කිරීමට පියවර ගනුලැබේ.

## *2.2.2 ගිණුම්කරණ අඩුපාඩු*

(අ) 2012 වර්ෂයේ ගිණුම් තුල මෙය නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ.

(ආ) 2012 වර්ෂයේ ගිණුම් තුල මෙය නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ.

(ඇ) සේවකයන් වෙනුවෙන් පාරිතෝෂික ප්‍රතිපාදන සැලසීම පිළිබඳව 2012 වර්ෂයේ ගිණුම් තුල නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ.

(ඈ) රුපියල් 27692/- ක් වටිනා Ventilation Fan එක 2011 දෙසැම්බර් 31 දිනට පොත් පත් අනුව ඉතිරිව තිබූ අතර භෞතිකව ඉතිරි නොගයේ තිබුණු බව තොග සමීක්‍ෂණ මණ්ඩලය විසින් හෙළිදරව් කර ඇති අතර මෙය 2012 ජනවාරි මස 17 වන දින සොබා 500 හි F 956814 දරන අයදුම් පතින් වාට්ටු අංක 02 ට නිකුත් කර ඇති බව පොත් පත් අනුව සනාථ වේ.

## ***2.2.3 ලැබිය යුතු ගිණුම්***

නිඟ උත්සව අත්තිකාරම් මුදල් ගෙවන ලෙස අදාල නිලධාරින්ට දන්වා යවා ඇත. නැවත වතාවක් සිහි කැඳවුම් යැවීමට කටයුතු කරනු ලැබේ. දැනට උත්සව අත්තිකාරම් ගෙවීමේදි පුද්ගල ඇප මත අත්තිකාරම් මුදා හැරීමට පියවර ගෙන ඇත.

## ***2.2.4 නීති,රීති, රෙගුලාසි හා කළමණාකාරීත්ව තීරණ වලට අනුකූල නොවීම***

(අ) අධ්‍යක්‍ෂ මණ්ඩල සමාජික සී.පී.වික්‍රමසිංහ මහතා වෙත වැඩිපුර ගෙවන ලද අධ්‍යක්‍ෂ මණ්ඩල දීමනා මුදල 2012 වර්ෂය තුල නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ.

(ආ) රජයේ ආයතන සහ නිලධාරින් සදහා සන්නිවේදන පහසුකම් සැපයීම හා බිල්පත් නිරවුල් කිරීම සම්බන්ධයෙන් 2011.04.30 දිනැති සොබ්‍ය ලේකම්ගේ අංක B5/TEP/S/04/2010 දරන චක්‍රලේඛ ලිපිය ප්‍රකාර එහි ඛාන්ඩ අංක (V) යටතේ පරිපාලන නිලධාරීන්ට මාසික උපරිම ඒකාබද්ධ වියදම් සීමාව රු 4000.00 බැගින් ගෙවීම් කල හැකි බව දක්වා ඇත. එහි පිටපතක් මේ සමග අමුණා ඇත. (ඇමුණුම 01)

(ඇ) විමසුමේ දැක්වෙන ගෙවිය යුතුමුදල 2007 සැප්තැම්බර් සිට 2008 දෙසැම්බර් දක්වා කාල පරිච්ජේදය සදහා මසකට රු 10866.74 ක් බැගින් රුපියල් 173867.84 ක් ගෙවිය යුතු මුදල වශයෙන් දක්වමින් ඉහත කාලපරිච්ජේදය සදහා වැඩිපුර රුපියල් 106132.16 ක් පරිපාලන නිලධාරි වෙත ගෙවා ඇති බව දක්වා ඇත.
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2007 ලිපියේ 02 ජේදයේ VI යටතේ ද්විතීක ශ්‍රේණියේ තනතුරට අදාලව විශ්‍රාම යන අවස්ථාවේ අවසන් වරට ලැබූ වැටුපෙන් 50% ක් හෝ රුපියල් 10000 යන දෙකෙන් වැඩිමුදල යන පදනම යටතේ රුපියල් 10866.74 පදනම් කරගෙන විමසුම් අංක HW/B/WKMH/2011/01 දරන විගණන විමසුමේ දීමනා ගණනය කරඇත.
විජය කුමාරතුංග අනුස්මරන රෝහලේ පරිපාලන නිලධාරි තනතුර මාණ්ඩලික ශ්‍රේණියට අයත් බව සොබ්‍ය අමාත්‍යාංශය විසින් දන්වා එවා ඇත.(ඇමුණුම 02) තවද කම්කරු දෙපාර්තමේන්තුවේ පරිපාලන නිලධාරි තනතුරට අදාලව විශ්‍රාමික නිලධාරින් කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙවීමේදී මාසික දීමනාව , විශ්‍රාම යන අවස්ථාවේදි ලබමින් සිටි වැටුපෙන් 50% ක් හෝ රු 17500 යන දෙකෙන් වැඩි මුදල බව කම්කරු කොමසාරිස් විසින් නිකුත්කර ඇති ලිපියකින් තහවුරු වේ .(ඇමුණුම 03) එමෙන්ම පරිපාලන නිලධාරි තනතුරේ සහ රජයේ මාණ්ඩලික නිලධාරින්ගේ තනතුරු වල පත්කිරීම් උසස්කිරීම් හා මාරුකිරීම් ආදි සියලු කටයුතු රාජ්‍යසේවා කොමිසම මගින් සිදු කරනු ලැබේ.
ඉහත සියලු කරණු සැලකිල්ලට ගනිමින් විමසුමේ දැක්වෙන කාල පරිච්ජේදයට අදාලව කොන්ත්‍රාත් පදනම මත පරිපාලන නිලධාරි මාසික දීමනාව රු 17,500 ක් වශයෙන් ගෙවා ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

(ඈ)රාජ්‍ය ව්‍යවසායන්හි වයස අවුරුදු 60 ඉක්මවූ නිලධාරින් නැවත සේවයට බදවා ගැනිම පිළිබදව අංක MH/AD/01/A/GE041 හා 2011.09.29 දිනැති සොබ්‍ය ලේකම්ගේ ලිපියෙන් උපදෙස් ලබාදී ඇත. එම ලිපියේ දක්වා ඇත්තේ 2011 අගෝස්තු 17 දින අමාත්‍යමණ්ඩල තීරණය පරිදි වයස අවුරු 60 ඉක්මවූ නිලධාරින් නැවත සේවයට බදවා

ගැනීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇති බවත්, සුවිශේෂී තත්වයක් යටතේ කෙටි කාලයකට හෝ වයස අවුරුදු 60 ඉක්මවූ නිලධාරියෙකු සේවයේ යෙදවීමට අවශ්‍ය වූ විටක ඒ සඳහා අමාත්‍ය මණ්ඩල සන්දේශයක් මගින් අනුමැතිය ලබාගත යුතු බවත්ය.

ඉහත ලිපිය ලැබීමෙන් පසුව අවුරුදු 60 ඉක්මවූ නිලධාරීන් සේවයේ යෙදවීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා යොමුකර ඇති බව කාරුණිකව දන්වමි.

එම ලිපිය ලැබීමට පෙර වයස අවුරුදු 60 ඉක්මවූ නිළධාරීන් සේවයේ යෙදවීමේදී 1999 අංක 38 දරණ විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩල පනත අනුව පාලක මණ්ඩලයට පවරා ඇති බලතල යටතේ පරිපාලන නිලධාරී ඇතුලු හෙද නිලධාරී 04 දෙනාගේ සේවය දීර්ඝ කිරීම සිදුකර ඇති බව දන්වා සිටිමි.

## 4.1 කාර්ය සාධනය

**(ඇ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව ඖෂධ වියදම වැඩිවී තිබීම.**

පහත දැක්වෙන කරුණු ඊට හේතු වී ඇත.

අවම මිල ගණන් යටතේ ඇස්තමේන්තු සකස් කලද වෛද්‍ය සැපයුම් අංශයේ ඖෂධ තොග නොමැති අවස්ථා වල දී ඒවා ඖෂධ සංස්ථාවෙන් ඇස්තමේන්තුකල මුදලට වඩා වැඩි මුදලකට මිලදී ගැනීමට සිදු වීම.

වෛද්‍ය සැපයුම් අංශයේ තොග අවසන් වූ අවස්ථා වලදී ඔවුන්ගේ තොග ප්‍රාදේශීය ගබඩා වලින් මිලට ගෙන මෙම රෝහල වෙත සපයනු ලබන අතර එහිදී වැඩි මිලකට සපයනු ලැබීම.

ඖෂධ වල වෙළඳ පොල මිල ගණන් වසර පුරා ස්ථාවරව නොපවතින අතර සමහර ඖෂධ වල මිල ඉහල යාම

සායන රෝගීන්ගේ ප්‍රතිකාර ක්‍රමවල වර්ධනය සහ ඊට සමගාමීව සමහර මිල වැඩි ඖෂධ භාවිතය වැඩිවීම.

රෝගී සත්කාර සේවය අඛණ්ඩව පවත්වාගෙන යාමේදී ඉහත සඳහන් හේතු මත ඖෂධ වියදම පෙර වසරට සාපේක්ෂව වැඩිවූ බව කාරුණිකව දන්වමි.

**(ඈ) සාමාන්‍ය ශල්‍ය කර්ම පසුගිය වසරට සාපේක්ෂව අඩුවීමක් පෙන්නුම් කිරීම.**

අනපේක්ෂිත ලෙස ශල්‍යාගාරයේ වායුසමීකරණ පද්ධතියේ ක්‍රියාකාරීත්වය ඇන හිටීම හේතුවෙන් 2010 අගෝස්තු සිට 2011 නොවැම්බර් දක්වා සාමාන්‍ය ශල්‍යකර්ම සිදු නොකිරීම.

2011 ජනවාරි සිට ක්‍රියාත්මක වන පරිදි සාමාන්‍ය ශල්‍යකර්ම ගාස්තුව රු 500 සිට රු 750 දක්වා වැඩි කිරීමද අතිරේක හේතුවක් විය .

## 4.2 කළමණාකරන දුර්වලතා

(අ) 2011.12.02 දිනැති අංක 636 වවුචරයෙන් රු.1,115,037 ක මුදලක් ජලය හා විදුලිය වෙනුවෙන් අක්ෂිදාන සංගමයට ගෙවීම.

මසකට අක්ෂි ශල්‍යකර්ම 1000 ට වැඩි ප්‍රමාණයක් සිදුකරමින් පැවති මෙම වකවානුවේ අනපේක්ෂිත ලෙස ශල්‍යාගාරයේ වායු සමීකරණ පද්ධතිය අකර්මන්‍ය වීම නිසා රෝගී සත්කාර නවත්වා දැමීම වෙනුවට වෙනත්

ආයතන වලින් එම සේවාව ලබාගැනීමට සොයා බැලීමට සිදුවිය. සාදාන,මීගමුව,උතුරු කොළඹ යන රෝහල් වල ශල්‍යාගාර සේවාව ලබා ගැනීමට උත්සාහකල නමුත් එලෙස කිරීමට හැකියාවක් නොමැති බැවින් බොරැල්ල අක්ෂිදාන සංගමයේ ශල්‍යාගාරය මේ සඳහා කෙටි කාලයක් වෙනුවෙන් යොදා ගැනීමට ගිවිසුමකින් තොරව ඉඩකඩ ලබාදෙන ලදි. නමුත් ටෙන්ඩර් ක්‍රියා පටපාටියේ කොන්ත්‍රාත් කරුවන් විසින් ශල්‍යාගාරයේ කටයුතු නිම කිරීමට බලාපොරොත්තු නොවූ ලෙස වැඩිපුර කාල සීමාවක් ගතවීම නිසා ජලය හා විදුලිය වියදමවත් ගෙවන ලෙස අක්ෂිදාන සංගමය විසින් ඉල්ලීමක් කරන ලදි. නමුත් මේ අවස්ථාව වන විට ඒ මුදල මාසික ගෙවීමට පිළියෙල කරගැනීමේ හැකියාවක්ද නොමැති විය.

කෙසේවුවද මෙම වකවානුව තුල විජය කුමාරතුංග රෝහලේ ශල්‍යාගාරය භාවිතා නොවූ නිසා ජලය හා විදුලිය වියදම් වල සැලකිය යුතු අඩුවීමක් සිදුවී ඇත.

ඊට කලින් වසරේ (2009 සැප්තැම්බර් සිට 2010 අගෝස්තු දක්වා)

| | |
|---|---|
| මාසික සාමාන්‍ය මුලු විදුලි බිල | රු 457 468.21 |
| ශල්‍යාගාරය භාවිතා නොකල (2010 සැප්තැම්බර් සිට 2011 අගෝස්තු දක්වා) | |
| මාසික සාමාන්‍ය විදුලි බිල | රු 364,352.52 |
| අඩුකලා | |
| ශල්‍යාගාරය භාවිතා නොකිරීම නිසා අඩුවූ මාසික සාමාන්‍ය වියදම | රු 93,115.69 |
| ශල්‍යාගාරය භාවිතා නොකිරීම නිසා අඩුවූ වාර්ෂික වියදම | රු 1,117,388.28 |
| ජලය හා විදුලිය වෙනුවෙන් අක්ෂිදාන සංගමයට අංක 636 වවුචරයෙන් ගෙවූ මුදල | රු 1,115,037.00 |

මෙම රෝහලේ වර්ෂයක් තුල ශල්‍යාගාරය භාවිතා නොකිරීම නිසා ඉතිරිවූ විදුලි වියදම 1,117,388.28 ක් වුවද ජලය හා විදුලිය වෙනුවෙන් අංක 636 දරන වවුචරයෙන් අක්ෂිදාන සංගමයට ගෙවා ඇත්තේ 1,115,037/- ක් පමණක් බව දන්වා සිටිමි. තවද ඉතිරි මුදල වූ 1,801,514.00 ක මුදල නොගෙවීමට පාලක මණ්ඩලය විසින් තීරණය කර ඇති බවද කාරුණිකව දන්වමි.

(ආ) රෝහලේ තොග පවත්වාගෙන යාමේදී සාමාන්‍ය තොග පරිභෝජනය කෙරෙහි අවධානය යොමු නොකර අධික තොග පවත්වාගෙන යාම

**තොග වර්ගය**

**<u>Stationary</u>**

| | |
|---|---|
| වාර්ෂික පරිභෝජනය | රු 318,625 |
| වර්ෂය අවසානයේ ඉතිරි තොගය | රු 187,717 |
| අවසාන තොගයේ අයිතම සංඛ්‍යාව | 79 |
| වර්ෂයේ පරිභෝජනයට සාපේක්ෂව තොගයේ ප්‍රතිශතය | 59% |

2011.12.31 දිනට අවසාන තොගයේ වටිනාකම අධික වීමට පහත කාරුණු ප්‍රධාන හේතුව වූ බව කාරුණිකව දන්වමි.

වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරිම යටතේ 2011.08.25 දිනැති අංක MH/AD/01/D/01/2011 දරන සෞඛ්‍ය ලේකම් ගේ ලිපියෙන් මෙම රෝහලේ 2010 වර්ෂයට අදාලව භාෂා ත්‍රයෙන්ම සකස් කරන ලද වාර්ෂික වාර්තාවේ පිටපත් 381 ක්

පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා සකස්කල යුතු බව දන්වා එවන ලදි. ඒ සඳහා මිලට ගත් පහත දැක්වෙන ලිපි ද්‍රව්‍ය 2011.12.31 දින වන විට පාවිච්චියට නොගෙන ගබඩාවේ ඉතිරිව තිබුණා.

A4 – කොල බන්ඩල 46 - රු 20930.00

මුද්‍රණය සඳහා තීන්ත    රු 30693.00

මුලු එකතුව    රු 51623.00

මුලු තොගයෙන් 28% ක් වූ ඉහත අයිතම දෙකක වටිනාකම ද අවසාන තොගයට එකතු වී ඇත.

**Consumables and General**

වාර්ෂික පරිභෝජනය    රු 460,233

වර්ෂය අවසානයේ ඉතිරි තොගය    රු 295,439

අවසාන තොගයේ අයිතම සංඛ්‍යාව    , 96

වර්ෂයේ පරිභෝජනයට සාපේක්ෂව තොගයේ ප්‍රතිශතය    64%

මෙම තොගය පහත පරිදි සකස් වී ඇත.

2011.12.15 දින අපද්‍රව්‍ය බැහැර කිරීමේ කලු පොලිතින් කවර 10000 ක් මිලට ගෙන ඇති අතර දෙසැම්බර් 31 වන විට එම තොගයෙන් 9860 ක් ඉතුරුව ඇති අතර එහි වටිනාකම රු 96628 කි. එය අවසාන තොගයෙන් 33% ක ප්‍රතිශතයකි. (අපද්‍රව්‍ය බැහැර කිරීමේ කවර නිෂ්පාදන ආයතන විසින් කවර 10000 ට අඩුවෙන් නිකුත් නොකරන බැවින් අවම ප්‍රමාණය වූ කවර 10000 ක් මිලට ගැනීමට සිදු විය.)

**Linen**

වාර්ෂික පරිභෝජනය    රු 212,732

වර්ෂය අවසානයේ ඉතිරි තොගය    රු 413,813

අවසාන තොගයේ පහත සඳහන් ද්‍රව්‍යයන්ද ඉතිරිව තිබිණි.

කොළපාට GS තුවා 500 -    රු 122,000

සුදුපාට GS තුවා 499 -    රු 44,710

සර්ජන් ඕවර්රෝල් 141 -    රු 49,350

මුලු එකතුව    රු 216,060

අවසාන තොගයට ප්‍රතිශතය 52%

පසුගිය වකවානුවේ රෝහලේ ශල්‍යාගාරයේ කටයුතු ඇනහිටීමෙන් ශල්‍යකර්ම සිදු නොකිරීම නිසා ඉහත ද්‍රව්‍ය පරිභෝජනයට නොගත් බැවින් ඉතිරි තොගයට ඇතුලත් වී ඇත. ඉදිරි කාලයේ ශල්‍යකර්ම සිදු කිරීමේ දී මේවා පරිභෝජනය සඳහා යෙදවෙන බව කාරුණිකව දන්වා සිටිමි.

(ඇ) උතුරු කොළඹ මහ රෝහලේ මහාචාර්ය ඒකකය සමග ගිවිස ගත් පරිදි මෙම රෝහලට ලැපරොස්කොපි යන්ත්‍රයක් 2009 වර්ෂයේදී මිලදී ගත් නමුත් පහත දක්වන කරුණු හේතුවෙන් භාවිතා කිරීමට නොහැකිවූ බව කාරුණිකව දන්වමි.

2010 අගෝස්තු සිට 2011 නොවැම්බර් දක්වා මෙම රෝහලේ ශල්‍යාගාරයේ වායු සමීකරන පද්ධතියේ ක්‍රියාකාරීත්වය අනපේක්ෂිත ලෙස ඇණහිටීම නිසා ශල්‍යකර්ම සිදු කිරීමට නොහැකි විය.
නිර්වින්දන වෛද්‍ය වරයකු නොමැති කම නිසා නිර්වින්දන ශල්‍යකර්ම කිරීමට නොහැකි විය. දැනට නිර්වින්දන වෛද්‍යවරයෙකු 2011.12.01 බඳවා ගෙන ඇති අතර උතුරු කොළඹ ශික්ෂණ රෝහලට දැනට පුහුණුවට යවා ඇති බව වැඩි දුරටත් දන්වා සිටිමි.

(ඇ) ආහාර සැපයීමේ කොන්ත්‍රාත්තුව සඳහා පසුගිය වර්ෂ කිහිපය පුරාවටම ටෙන්ඩර් පත් ඉදිරිපත් කර ඇත්තේ සැපයුම් කරුවන් දෙදෙනෙකු වූ අතර එයින් අඩුම මිළ ගණන් ඉදිරිපත් කර ඇත්තේ එරන්දි සප්ලයර්ස් ආයතනය විසිනි. 2011 වර්ෂයේද සැපයුම්කරුවන් දෙදෙනෙක් පමණක් ටෙන්ඩර්පත් ඉදිරිපත් කල අතර අඩුම මිල ගණන් ඉදිරිපත් කල එරන්දි සප්ලයර්ස් ආයතනය වෙත ටෙන්ඩරය පිරිනමා ඇති බව කාරුණිකව දන්වමි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ මුල් මාස 06 තුල අක්ෂි ශල්‍යකර්ම ප්‍රමාණය අඩුවී තිබුණද අතිකාල පැය ගණනේ වෙනසක් දක්නට නොලැබීම

ක්‍රමවත්ව හා නිසියාකාරව වන්දීකෘත පිළිවෙත් අනුගමණය කරමින් ශල්‍යකර්ම සිදු කිරීමට අවශ්‍ය ප්‍රමිතියට ශල්‍යාගාරය සූදානම් කිරීමට ශල්‍යාගාර කාර්ය මණ්ඩලය බැඳී සිටී. එයට ශල්‍යකර්ම වලට බඳුන්වන රෝගීන්ගේ සංඛ්‍යාවේ අඩු වැඩි වීමේ බලපෑමක් නැත. මන්ද ශල්‍යාගාරය පිළියෙල කිරීමට ගතවන කාලය රෝගීන් සංඛ්‍යාව අනුව වෙනස් නොවන බැවිනි. එසේ නිසි ප්‍රමිතියට ශල්‍යාගාරය සූදානම් නොවුනහොත් ශල්‍යකර්ම සඳහා භාජනය වන රෝගීන්ගේ ඇස් අසාදන වලට භාජනය වී ඔවුන් දැඩි අපහසුතාවලට ලක්විමට ඉඩ ඇත. එබැවින් රෝගීන් ශල්‍යාගාරය තුලට ඇතුලු කිරීමට ප්‍රථම ශල්‍යාගාර කාර්ය මණ්ඩලය ශල්‍යාගාරය වෙත ලගාවිම අත්‍යාවශ්‍ය වේ.

එසේම ශල්‍යකර්ම අවසාන වූ පසුව අක්ෂිදාන සංගමයේ ශල්‍යාගාරය පිරිසිදු කර අදාල යන්ත්‍ර සූත්‍ර හා උපකරණ නිසි ලෙස තබා ඒමද කල යුතුවේ. තවද අක්ෂි ශල්‍යකර්ම සඳහා භාවිතා වන සියුම් උපකරණ ගණන් ගැනීමෙන් අනතුරුව නිසියාකාරව අසුරා තබා ඊලග දිනයේ ශල්‍යකර්ම සඳහා විෂබීජහරණය කරවීමට භාරදීම සඳහා සූදානම් කිරීමේ වගකීමද ශල්‍යාගාර කාර්ය මණ්ඩලයට පැවරී ඇත. එකී වගකීම් ඉටුකිරීමේ කාර්යයන්හි ශල්‍යාගාර කාර්ය මණ්ඩලය නියුතු වූබව සඳහන් කරනු කැමැත්තෙමි.

එසේම ශල්‍යාගාර කාර්ය මණ්ඩලයේ සියලුම අයවලුන් සඳහා සිදුව රෝහලේ සිට අක්ෂිදාන සංගමය සඳහා යෑම ඒම සඳහා සපයා තිබුනේ එක් වාහනයක් බැවින් කාර්ය මණ්ඩලයේ සියලු දෙනාම එකම අවස්ථාවේ යෑම් ඒම් සිදුකල බව දන්වනු කැමැත්තෙමි.

විමසුමේ දැක්වෙන පරිදි අක්ෂි ශල්‍යකර්ම ප්‍රමාණය අඩු වුවද කාර්ය මණ්ඩල අතිකාල පැය ගණනේ වෙනසක් නොවීමට ඉහත කරුණු බලපා ඇති බව කාරුණිකව දන්වමි.

(ඊ) ශල්‍යකර්ම සඳහා යොමුකල රෝගීන් සංඛ්‍යාවට වඩා ශල්‍යකර්ම සිදුකර තිබීම .

අක්ෂි ශල්‍යකර්ම සදහා රෝගීන් අදාල කාර්ය පටිපාටිය සම්පූර්ණ කිරීමෙන් පසුව ශල්‍යකර්ම සිදුකිරීම සදහා බොරැල්ල අක්ෂිදාන සංගමය වෙතපිටත් කරනු ලබයි. එහි ශල්‍යාගාරයේදී "රෝගීන් ඇතුල් කිරීමේ හා පිට කිරීමේ ලේඛණය " මගින් සියලු රෝගීන්ගේ විස්තර පහත පරිදි වාර්තා කර ඇත.

**කාර්යාල තොරතුරු**

දිනය

ශල්‍ය වෛද්‍යවරයාගේ නම

සහාය කාර්යමණ්ඩලයේ නම්

**රෝගීන්ගේ තොරතුරු**

අනු අංකය

නම

වයස

ස්ත්‍රී / පුරුෂ භාවය

වාට්ටු අංකය

ඇඳ ඉහපත් අංකය

ශල්‍යකර්මය සිදුකල ඇස

2011.08.02 හා 2011.06.07 යන දින දෙකේ හැර අනෙක් සියලුම දින වලදී "රෝගීන් ඇතුල් කිරීමේ හා පිට කිරීමේ ලේඛණයේ " ශල්‍ය කර්ම සංඛ්‍යාව සමග කාර්ය සාධන තොරතුරු අනුව ශල්‍ය කර්ම සංඛ්‍යාව සමාන වේ. යම්කිසි ප්‍රමාද දෝෂයකින් ඉහත දින දෙකේදී "රෝගීන් ඇතුල් කිරීමේ හා පිට කිරීමේ ලේඛණයේ " ශල්‍යකර්ම සංඛ්‍යාවට වඩා කාර්ය සාධන තොරතුරු වල ශල්‍යකර්ම සංඛ්‍යාව එකක් බැගින් වැඩි වී ඇත.

පිටස්තර ප්‍රදේශවල සිට පුද්ගලික වාහන වලින් සිදුව රෝහලට පැමිණි රෝගීන් මෙම වකවානුව තුල රෝහලේ සිට අක්ෂිදාන සංගමය දක්වා තම පුද්ගලික වාහන වලින් රෝගීන් ප්‍රවාහනය කර ගත් අවස්ථා ඇත. රෝහල මගින් සපයන ලද බස්රථ මගින් ප්‍රවාහනය කල රෝගීන් සංඛ්‍යාවට වඩා ශල්‍යකර්ම සිදුකල සංඛ්‍යාව වැඩි වීමට එය හේතුවී ඇතිබව කාරුණිකව දන්වමි.

( උ) 2012.03.17 දින පැවති නියදි තොග පරීක්ෂාවේ දි පොත් අගයන් සහ භෞතික සත්‍යාපන අගයන් අතර විචලනයන් පැවතීම.

2012.03.17 දින සිදුකල නියදි පරීක්ෂාවේදි තොග පොත් වලඅයිතම අගයන් සහ භෞතික සත්‍යාපන අගයන් අතර විචලනයන්ට මූලික හේතුව වී ඇත්තේ ප්‍රමාදදෝෂය කින් නිකුත් කිරීම් හා ලැබීම් අදාල තොග පොත් වල සටහන් නොකිරීමයි. දැනට එම අඩුපාඩුව මග හරවා ගෙන ඇති අතර සියලුම තොග පොත්වල සටහන් යාවත්කාලීන කර ඇති බව කාරුණිකව දන්වමි.

## 4.3 කොන්ත්‍රාත් පරිපාලන දුර්වලතා

### රෝහලේ වායු සමීකරණ පද්ධතියේ අලුත්වැඩියාව

ඇ. Lamina Flow ක්‍රමය ඉතාමත් විශේෂිත වූ ක්‍රමයකි . මේ පිළිබඳ තාක්ෂණික පිරිවිතර ගොනු කර ඊට අවශ්‍ය සැලැස්ම නිර්මාණය කර මෙම ටෙන්ඩර් ක්‍රියාවලියට අවශ්‍ය මූලික කොන්දේසි ඇතුලත් පත්‍රිකාවක් මෙම ක්‍රියාලියේ තාක්ෂණික ඇගැයීම් කමිටු සභාපතිවරයාව සිටි Consultant Electric Engineer C. Koelmeyer මහතා විසින් සකසන ලද අතර එය C.E.C.B. ආයතනය වෙත ලබා දී ඇත. එම උපදෙස් අනුව නවීකරණ ක්‍රියාවලිය සිදු වුනු අතර එය සතුටුදායක අන්දමින් සිදු වූ බව අමාත්‍යාංශ ඉංජිනේරුවරයාද සහතික කර ඇත.

මේ පිළිබඳව ගිවිසුමකට එළඹීමට ඉහත කරුණු වලට අමතරව කොන්ත්‍රාත් කාලය සම්බන්ධව නිශ්චිත තීරණයක් අවශ්‍යව තිබුනි . එය තීරණය කිරීමට නොහැකි විය .එයට හේතුව පහත ආ. කොටසේ දක්වා ඇත. එබැවින් විධිමත් ගිවිසුමක් සකසා ගත නොහැකි විය.

ආ. ටෙන්ඩර් ක්‍රියාවලිය අවසානයේදී අංක WKMH/C1/14/10 හා 2010/11/09 දිනැති ලිපිය මගින් ටෙන්ඩරය ප්‍රධානය කල අතර ඊට පිළිතුරු වශයෙන් C.E.C.B. ආයතනය විසින් එවන ලද අංක CB/BS/C/HW/EM/WMS/04 හා 2010/11/09 දිනැති ලිපියට අවධානය යොමු කරවමි .( ඇමුණුම 4 ) එහි අංක 4 කරුණු වලට අනුව Hepa Filters සවි කිරීම සම්බන්ධව නිශ්චිත කාල සීමාවක් සඳහන් කිරීමට හැකියාවක් නොමැති බව දන්වන ලදි. මේ පිළිබඳව අප ඔවුන් සමග සාකච්ඡා කල අතර එහිදී පෙන්වා දෙන ලද්දේ Duct System තිබෙන ආකාරයට තබා Hepa Filters වල ප්‍රමාණය වෙනස් කිරීමත් , Hepa Filters ලංකාවේ නිශ්පාදනය නොකිරීම සහ අදාල සමාගමත් සමග සෘජුවම සම්බන්ධ වී එම රටට ගොස් අවශ්‍ය මිනුම් වලට අනුව filters සාදවා ගැනීම සඳහා ඇති හැකියාව වැනි සංකීර්ණ කාර්‍යන් රැසක් ඉටු කර ගැනීමට ඇති බවය .මෙවැනි තත්වයක් යටතේ ඔවුනට නියමිත කාල සීමාවක් දිය නොහැකි බවත් මාස 6 කින් පමණ කඩිනමින් නිම කරවා දීමට හැකි බව පවසන ලදි.

තවද මෙම කටයුත්ත හැකි ඉක්මනින් කර ගැනීම සම්බන්ධව නිතරම අප ඔවුන් සමග සාකච්ඡා කරන ලද බව වැඩිදුරටත් දන්වමි .අලුත්වැඩියාව අතරතුර බිම සැකසීම පිළිබඳ පැන නැගුනු ගැටලුවක් හේතුවෙන් බිම සැකසීමට යොදා ගන්නා රසායන ද්‍රව්‍ය ජර්මනියෙන් ආනයනය කිරීමට සිදු විය . එහිදී තවත් මාස 2 ක් 3 ක් පමණ ගත විය .එබැවින් කොන්ත්‍රාත්තුව අවසන් කිරීමේ නිශ්චිත දිනයක් තීරණය කර ගැනීමට නොහැකි විය .කොන්ත්‍රාත් කොන්දේසි වල ප්‍රමාද ගාස්තුව රු. 25,000 ලෙස දක්වා තිබුනද ඒ සඳහා ගිවිසුමකට එළඹීමක් සිදු නොවිය .නිශ්චිත අවසන් දිනයක් නොමැතිව මෙවැනි ප්‍රමාද ගාස්තුවක් අය කිරීමට හැකියාවක් නොමැති බව මෙයින් පෙනී යයි.

ඇ. යෝජිත අතිරේක කාර්‍යන් සඳහා C.E.C.B. ආයතනයෙන් ප්‍රථමයෙන් මිල ගණන් ලබා ගන්නා ලදි. එම මිල ගණන් 2011/01/26 දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කරන ලදි. එදින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට සෞඛ්‍ය අමාත්‍යාංශ අතිරේක ලේකම් පී.පී.මහිපාල මහතා ද සහභාගී විය .මෙම අමතර කාර්‍යන් මධ්‍යම උපදේශක කාර්‍යයාංශය වෙතින්ම කර ගැනීම සුදුසු බව මෙම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමතිය ලැබී ඇත. ඉන් අනතුරුව ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ' අනුමැතියද ලබා ගෙන ඇත.

ඇ. ප්‍රධාන කාර්යය C.E.C.B. මගින් කරන අතරතුර වෙනත් ආයතනයක් ලවා අමතර කාර්යන් කරවා ගැනීම ප්‍රායෝගික නොවන බැවින් අමතර කාර්යන් ද මධ්‍යම උපදේශක කාර්යයාංශය වෙතින් කර ගැනීම සුදුසු බව අමාත්‍යාංශ ප්‍රධාන ඉංජිනේරු නිර්දේශ කර ඇති බව ලිපි ගොනු වලින් පැහැදිලි වේ .මෙම අමතර කාර්යන් මධ්‍යම උපදේශක කාර්යයාංශය වෙතින්ම කර ගැනීම සුදුසු බව 2011/01/26 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමත වී ඇත. ඉහත කරුණු වලට අනුව අතිරේක කාර්යන් සඳහා මිල කැඳවීම් කිරීමට කාලය ගත වන බවත් ඉහත කාර්යන් මේ මොහොතේම සිදු කර ගැනීමේ අවශ්‍යතාවය ඊට වඩා බෙහෙවින්ම වැඩි බවත් පෙනී යන හෙයින් එසේ සිදු කරන ලදී .අමතර හා අතිරේක වැඩ සඳහා රෝහලේ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ පූර්ව අනුමැතිය ලබා ගෙන ඇත.

ඉ. අමතර කාර්යන් නිරීක්ෂණ කර ගැනීමට නිලධාරී මඬුල්ලක් විසින් නිරීක්ෂණයක් පැවැත්විය. එම නිරීක්ෂණය සඳහා අමාත්‍යාංශ ඉංජිනේරුවරයා ද සහභාගී විය .( ඇමුණුම 5 ) එහිදී කල සාකච්ඡාවට අනුව කල යුතු අතිරේක කාර්යන් මොනවාදැයි තීරණය විය .තවද මේ පිළිබඳ අමාත්‍යාංශ කාර්මික ඉංජිනේරුවරයා අධ්‍යයනය කර ප්‍රධාන ඉංජිනේරු මහතාගේ නිර්දේශයක්ද එවන ලදී .ඊට අමතරව වෙනම ඇස්තමේන්තු සැකසීම වැනි කාර්යන් අමාත්‍යාංශ ප්‍රධාන ඉංජිනේරු වරයා වෙතින් ඉටු කර ගත නොහැක.

අමතර හා අතිරේක වැඩ සඳහා ගෙවීම් කිරීමේදී අමාත්‍යාංශ කාර්මික ඉංජිනේරුවරයාගේ සහතිකය ලබා ගෙන ඇත.

ඊ. වැඩිපුර ගෙවා ඇති රු.341,824.00 ක මුදල ගෙවීමට ඇති රඳවාගත් මුදලින්
පියවාගෙන බැර විස්තර වාර්තා කිරීමට කටයුතු කරනු ලැබේ .

උ. 2011.08.29 දිනැති අමාත්‍යාංශ ඉංජිනේරුගේ වාර්තාවට අනුව බිම් සැකසීම සඳහා රු. 798,000 ලෙස දක්වා තිබුනද( ඇමුණුම 6 ) අවසාන බිල්පත ඉදිරිපත් කල අවස්ථාවේදී. බිම් සැකසීම යටතේ රු.1611,120.00 ගෙවීමට අමාත්‍යාංශ යාන්ත්‍රික ඉංජිනේරුවරයා විසින් සහතික කර ඇති බව කාරුණිකව දන්වමි. ( ඇමුණුම 7 )

## <u>5.1 ක්‍රියාකාරී සැලැස්ම</u>

(අ) GDX යන්ත්‍රය මිලදී ගැනීමට තාක්ෂණික ඇගැයීම් කමිටුක් පත් කරන ලෙස අප විසින් අමාත්‍යාංශයට ලිපි යවා ඇත. ඒ සඳහා පත් කරන ලද ජීව වෛද්‍ය ඉංජිනේරු මහතාට එම යන්ත්‍රය පිළිබඳ දැනුමක් නැති බවත් අවශ්‍ය පිරිවිතර ඔහු සතුව නොමැති බැවින් ඔහුගෙන් එම කටයුත්ත නිසි ඉටු කර ගැනීමට නොහැකි බව දන්වන ලදී.තවද මෙම යන්ත්‍රය මීට පෙර රජයේ රෝහලකට ආනයනය කර නොමැති බවත් දැන්විය .එබැවින් එය මිලදී ගැනීමේ කටයුතු ආරම්භ කර ගැනීමට නොහැකි විය .

ඊට අමතරව GDX යන්ත්‍රය ග්ලුකෝමා තත්වයට ප්‍රතිකාර කිරීම සඳහා යොදා ගන්නා ඉලෙක්ට්‍රොනික් යන්ත්‍රයකි .GDX යන්ත්‍රයෙන් කෙරෙන කාර්‍යයට අමතරව තවත් ඇසට සම්බන්ධ පරීක්ෂණ කිපයක්ම කර ගත හැකි වෙනත් වටිනා යන්ත්‍රයක් ඇති බවත් එය මිලදී ගැනිම වඩා වාසිදායක බවත් අක්ෂි ශල්‍ය වෛද්‍යවරයා එම වකවානුවේදී පැවසීම නිසා GDX යන්ත්‍රය මිලදී ගැනිම අත්හිටුවා වඩා වාසිදායක යන්ත්‍රය පසුව මිලදී ගැනිමට තීරණය කල බව කාරුණිකව දන්වමි.

(ආ) මේ සඳහා කොන්ත්‍රාත්කරුවන් සොයා ගැනිමට අපහසු විය . රෝහලේ නව ගොඩනැගිල්ල ඉදි කරනු ලැබූ කොන්ත්‍රාත්කරු ලවා අවසාන කාර්තුවේදී කරවා ගැනිමට කටයුතු යොදන ලදී .

(ඇ). High Pressure Sterilizer සහ Slit Lamp යන උපකරණ මිලදී ගැනිම සඳහා තාක්ෂණික ඇගැයිම් කමිටු වාර්තා ලබා ගැනිමට මාස 2 ක 3 ක පමණ කාලයක් ගත විය . ඊට හේතු ,

- අදාල ජීව වෛද්‍ය ඉංජිනේරු මහතා කාර්‍ය බහුල බැවින් කමිටු රැස්වීම් පැවැත්වීම අසීරු විය .ඔහුට හැකි වූ මුල් අවස්ථාවේදීම ඒ සඳහා යොමු වන බව දන්වා සිටියේය.
- තවද ජීව වෛද්‍ය ඉංජිනේරු ආයතනයේ ලිපි සකස් (type ) කර ගැනිමට නිලධාරීන් නොමැති වීමෙන් අප කාර්‍යාලයේ ලිපිකරුවන්ට ඔවුන්ගේ රාජකාරී වලට අමතරව එම ආයතනයට ගොස් වාර්තා සකසා ගැනිමට හා නැවත නිවැරදි කර ගැනිමට කිප වතාවක්ම අමාත්‍යාංශයට යාමටත් සිදු වූ අතර ඒ සඳහා දිගු කාලයක් ගත විය .

High Pressure Sterilizer සහ' Slit Lamp යන උපකරණ මිලදී ගැනිම සඳහා 2011 තුන්වන කාර්තුවෙදි ඇණවුම් යැවීමට කටයුතු කරන ලදී .

## 5.2 අයවැය ලේඛනමය පාලනය

2011 වර්ෂයේ අයවැය ලේඛනය හා සත්‍ය වියදම් අතර විචලනයන් පිළිබඳ සැලකීමේදී පුනරාවර්තන වියදම් යටතේ ගමන් වියදම් දේශිය, පුවත්පත් දැන්වීම් හා පවිත්‍රතා සේවය යන වියදම් ශිර්ෂයන්ගේ ඇස්තමේන්තු අගය ඉක්මවා වියදම් සිදුවී ඇති බව දැක්වේ. ඊට හේතුවූ කරුණු පහත පරිදි දැක්විය හැකිය.

### ගමන් වියදම්

මෙම රෝහලේ ශල්‍යාගාරයේ වායු සමීකරණ පද්ධතිය අලුත්වැඩියා කිරීම නිසා මෙම වර්ෂය තුල අක්ෂි ශල්‍යකර්ම සිදු කිරීම බොරැල්ල අක්ෂිදාන සංගමයේ ශල්‍යාගාර වලින් කරවා ගැනිමට සිදුවිය. 2011 වාර්ෂික ඇස්තමේන්තුව සකස් කිරීමේදී දේශිය ගමන් වියදම් යටතේ තක්සේරුකල පිරිවැයට වඩා අතිරේක වියදමක් බොරැල්ල අක්ෂිදාන සංගමයට යාම්ඊම් සඳහා කාර්ය මණ්ඩලයට ගෙවීමට සිදුවීමෙන් මෙම තත්වය උදාවූ බව කාරුණිකව දන්වමි.

**පුවත්පත් දැන්වීම්**

මෙම වකවානුව තුල බඳවා ගැනීම් යටතේ

ඖෂධවේදි 01

පරිපාලන නිලධාරී 01

අක්ෂි වෛද්‍යවරු 01

සැපයුම් සේවා සඳහා මිලගණන් කැඳවීම

වෛද්‍ය උපකරන මිලට ගැනිම ආදී කටයුතු සඳහා පුවත්පත් දැන්වීම් පලකිරීමට සිදුවිය. ඇස්තමේන්තු සකස්කරන අවස්ථාව වන විට පුවත්පත් දැන්වීම් එක් භාෂාවකින් පලකිරීම ප්‍රමාණවත් වූ අතර ඒ අනුව ඇස්තමේන්තු සකස් කරන ලදී. නමුත් ප්‍රායෝගික තත්වයවූයේ පුවත්පත් දැන්වීම් භාෂා ත්‍රයෙන්ම පල කිරීම අනිවාර්ය බවයි. මේ නිසා ඇස්තමේන්තු අගය ඉක්මවා වියදම සිදුවූ බව කාරුණිකව දන්වමි.

**පවිත්‍රතා සේවය**

2011 පවිත්‍රතා සේවය යටතේ නිවැරදි ඇස්තමේන්තු අගය රු 3,200,000.00 වුවත් ප්‍රමාද දෝෂයකින් පවිත්‍රතා සේවය යටතේ ඇස්තමේන්තු අගය රු 320,000.00 ක් වශයෙන් දක්වා ඇතිබව කාරුණිකව දන්වමි. ඉදිරියේදි ඇස්තමේන්තු සකස් කිරීමේ දී මීට වඩා සැලකිලිමත්ව කටයුතු කිරීමට අදාල අංශවලට උපදෙස් දී ඇති බව කාරුණිකව දන්වමි.

## *<u>6. පද්ධති හා පාලන දුර්වලතා</u>*

මෙම ජේදය යටතේ පෙන්වා දී ඇති දුර්වලතා හැකිතරම් දුරට අවම කර ගැනීමට ඉදිරියේදි අවශ්‍ය පියවර ගනු ලැබේ.

වෛද්‍ය පී.එස්. ජයලත්
කාර්යභාර වෛද්‍ය නිලධාරි
විජය කුමාරතුංග අනුස්මරණ රෝහල - සිදුව